# කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk

කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0115 978987, 0115 886186 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk

Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk


## හදිසි නීතිය නැතුවම බැරි ඇයි?

අත්‍යවශ්‍ය ආහාර සැපයීමේ හිඟයක් ඇති නොවීම සහතික කිරීම සඳහා ආණ්ඩුව හදිසි නීතිය පැනවීම සමාජය තුළ සැකයක්, භීතියක්, අවිනිශ්චිතබවක් ඇති කිරීමට හේතු වී තිබේ. මේ සැකය, භීතිය, අවිනිශ්චිතභාවය සාධාරණ තත්ත්වයකි. කුමන කාරණයක් අරබයා පනවනු ලැබුවත් හදිසි නීතිය යනු පාලනය සඳහා නොව මර්දනය සඳහා පවතින නීතියක් වන බැවිනි. කෙසේ වෙතත් මේ අවස්ථාවේ ආණ්ඩුවට හදිසි නීතිය පැනවීමට හේතු වූයේ කුමක් නිසාදැයි විමසීමක් නොකර හදිසි නීතිය පැනවීම ගැන නිර්වචන ඉදිරිපත් කිරීම එතරම් යුක්ති සහගත නොවනු ඇත.

ආණ්ඩුව හදිසි නීතිය පැනවීමට පියවර ගත්තේ ව්‍යාපාරික මාෆියාව හිතාමතා රට තුළ ආහාර හිඟයක් ඇති කිරීමට කටයුතු කරමින් සිටි නිසාය. ව්‍යාපාරිකයන් සහල්, සීනි වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ සැඟවීම නිසා එක් අතකින් මෙම භාණ්ඩවල හිඟයක් ඇති වූ අතර ඇතැම් භාණ්ඩවල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගියේය. මේ ආකාරයට භාණ්ඩ සඟවන හා ලියාපදිංචි නැති ගබඩා පවත්වාගෙන යන ජාවාරම්කරුවන් භාණ්ඩ තොග පමණක් නොව ඒවා ගබඩාකර තිබූ ගොඩනැගිලි පවා රාජසන්තක කරන්නටද හදිසි නීති රෙගුලාසි යටතේ නෛතික ප්‍රතිපාදන සලසා දී තිබේ. රට ජාතික ව්‍යසනයකට මුහුණ දී තිබියදී ජනතාවගේ ආදායම් අහිමි වී සිටියදී අත්‍යවශ්‍ය භාණ්ඩ සැඟවීමට කිසිසේත්ම ඉඩදිය නොහැකිය. එහෙත් විපක්ෂය තර්ක කරන්නේ ඒ සඳහා පවතින නීති ප්‍රතිපාදන ප්‍රමාණවත් නිසා හදිසි නීතිය පැනවීමේ අවශ්‍යතාව නොමැති බවය. ආණ්ඩුව අත්‍යවශ්‍ය භාණ්ඩ සම්පාදනයට මුවා වෙමින් හදිසි නීතිය පනවන්නේ විරුද්ධ මතධාරීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන් මර්දනයට බව ඔවුන් චෝදනා කරන්නේ මේ නිසාය.

ඇත්තෙන්ම සැඟවූ භාණ්ඩ තොග පිටතට ගැනීම සඳහා ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන තිබේ නම් හදිසි නීතිය පැනවීම පිළිබඳ බියක් ඇතිවීම සාධාරණය. එහෙත් වෙළෙඳ මාෆියාව පාලනය කිරීමට පවතින නීති භාවිත නොවූයේ මන්ද යන්නද ඒ සමගම සොයා බැලිය යුතුය. නීති සම්පාදනය කරන්නේ පාර්ලිමේන්තුව වුවත් එම නීති ක්‍රියාත්මක කරන්නේ නිලධාරීන් විසිනි. එසේ නම් පවතින නීති ක්‍රියාත්මක නොවූයේ මන්දැයි පිළිතුරු දිය යුත්තේ නිලධාරීන්ය.

ජාවාරම්කරුවන්ට එරෙහිව පවතින නීතිය ක්‍රියාත්මක වී නැත්තේ නිලධාරීන්ද මෙම මාෆියාවේ කොටස්කරුවන් බවට පත් වී තිබෙන නිසාද යන්න සොයා බැලිය යුතු කාරණයකි. අපේ රටේ බොහෝ තැන්වලදී නිලධාරීන් සිටින්නේ පොදු ජනතාවගේ පැත්තේ නොව ව්‍යාපාරිකයන්, ජාවාරම්කරුවන්, ව්‍යවසායකයන් සමගය. මත්කුඩු ජාවාරමේදී පවා මේ තත්ත්වයේ වෙනසක් නැත.

එසේ නොවේ නම්, ඇතැම් විටෙක නිලධාරීන් පවතින නීතිය ක්‍රියාත්මක නොකරන්නේ එක්කෝ ඔවුන්ට ඒ සඳහා ධෛර්යයක් නොමැති නිසා විය හැකිය. නැතිනම් නීතිය තිබුණත් ඒ සඳහා අවශ්‍ය කෙරෙන යටිතල පහසුකම්වල ප්‍රශ්නයක් නිසා විය හැකිය. ප්‍රශ්නය කුමක් වුවත් එය විසඳනවා වෙනුවට හදිසි නීතිය පැනවීම අඩුව තිබියදී අත පුච්චා ගැනීමක් වැනි බව කිව යුතුය.

කුමන තර්කයක් ඉදිරිපත් කළත් මේ වන විට අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා හදිසි නීතිය පනවා අවසන්ය. මේ නිසා දැන් කළ යුතුව ඇත්තේ තවදුරටත් හදිසි නීතිය පැනවීමේ භයානකකම පිළිබඳ කතා කරමින් සිටීම නොව ආණ්ඩුව එය භාවිත කරන්නේ කුමන අරමුණකින්දැයි විමසිලිමත් වීමය. හදිසි නීතිය යනු මර්දනකාරී නීතියක් බව සැබෑ නමුත් ඒ නීතියම ජාතික ව්‍යසන අවස්ථාවකදී මහජන සුබසිද්ධිය සඳහා ද භාවිත කළ හැකි නිසාය. තමන් මෙම නීතිය භාවිත කරන්නේ මහජන සුබසිද්ධිය වෙනුවෙන්ද, මර්දනය අවියක් ලෙසද යන්න ඔප්පුකර පෙන්වීමේ වගකීම ඇත්තේ ආණ්ඩුවටය.

යම් හෙයකින් හදිසි නීතිය යටතේද සැඟවූ අත්‍යවශ්‍ය භාණ්ඩ අත්කර ගෙන භාණ්ඩ හිඟයක් ඇතිවීම වැළැක්වීම පමණක් නොව ජාවාරම්කරුවන්ට දඬුවම් කිරීම වැනි පියවර ගන්නට අසමත් වුවහොත් හදිසි නීතිය පනවනු ලැබුවේ විරුද්ධවාදීන් මර්දනය කරන්නට යැයි කියන සැකය තවදුරටත් තහවුරු වීම වැළැක්විය නොහැකි වනු ඇත. එසේම හදිසි නීතිය පැනවීමේ ප්‍රකාශිත අරමුණ ළඟා කරගන්නට අසමත් වුවහොත් එම නීතියද විහිළුවක් බවට පත් වීමද වැළැක්විය නොහැකි වනු ඇත.

හදිසි නීතිය මර්දනකාරී නීතියක් බව සැබෑ නමුත් විපක්ෂය ඒ බව හුවා දක්වමින් ආණ්ඩුවට චෝදනා කරන්නේ අවංකවම ජනතාව වෙනුවෙන්ද යන්නද මෙහිදී විමසා බැලිය යුතුය. ඇත්තෙන්ම ඔවුන් පෙනී සිටින්නේ ජනතාව වෙනුවෙන් නම්, හදිසි නීතිය පැනවීම සම්බන්ධයෙන් ආණ්ඩුවට චෝදනා කරන්නා සේම අත්‍යවශ්‍ය භාණ්ඩ සඟවා ජනතාව පීඩාවට පත්කරන ව්‍යාපාරික මාෆියාවටද ඔවුන් චෝදනා කළ යුතුය. එහෙත් රට දුෂ්කර තත්ත්වයකට මුහුණ දී සිටින මේ අවස්ථාවේ භාණ්ඩ සඟවමින් අසාධාරණ ලාභ ලබන්නට උත්සාහ නොකරන ලෙස හෝ ඔවුන් ව්‍යාපාරිකයන්ගෙන් ඉල්ලා නැත. ඔවුන් කරමින් සිටින්නේද උෟරන් කැකුණ තලන විට හබන් කුකුළන්ට ජය මඟුල් කීවා සේ ව්‍යාපාරික මාෆියාව විසින් ඇතිකර තිබෙන භාණ්ඩ හිඟය ප්‍රයෝජනයට ගනිමින් ලාභ දේශපාලන වාසි ලබා ගන්නට කටයුතු කිරීමය. ඔවුන්ගේ මේ උගුලේ නොවැටී සිටින්නට නම් ආණ්ඩුව කළ යුත්තේ පනවනු ලැබූ හදිසි නීතිය හෝ හරියට අදාළ අරමුණ සඳහා පමණක් භාවිත කිරීමය.

ඇතිව තිබෙන තත්ත්වය විසින් ආණ්ඩුව තේරුම්ගත යුතු තවත් සත්‍යයක් තිබේ. පවතින ක්‍රමයේ විශාල ප්‍රශ්නයක් තිබෙන බවය. ආණ්ඩුවට අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීම සහතික කරගැනීම සඳහා ද හදිසි නීතිය පැනවීමට සිදුවන්නේ ඒ නිසාය. මීට පෙරත් කිහිප වරක්ම සහල් හා සීනි සඳහා උපරිම සිල්ලර මිලක් පනවමින් ගැසට් නිවේදන කිහිපයක්ම නිකුත් කෙරිණ. එහෙත් ඒ එකදු අවස්ථාවක හෝ මෙරට ව්‍යාපාරික ප්‍රජාව එම ගැසට් නිවේදන පයිසයකටවත් මායිම් කළේ නැත. එසේ වූයේයැයි ආණ්ඩුවට කරන්නට දෙයක් තිබුණේද නැත. ආණ්ඩුවට ව්‍යාපාරික මාෆියාව හමුවේ දණ ගසන්නට සිදු වන්නේ කුමක් නිසාදැයි දැන්වත් කල්පනා කළ යුතු නොවේද?

කොයිතරම් වහසි බස් දෙඩුවත්, තවමත් පෞද්ගලික සහල් මාෆියාව පාලනය කරගන්නට ආණ්ඩුවට හැකි වී නැත. ආණ්ඩුව සහල් සඳහා උපරිම සිල්ලර මිලක් නියම කළ සැණින් වෙළෙඳපොළ සැපයුම සීමා කරන්නට මහා පරිමාණ සහල් ව්‍යාපාරිකයන් තීරණය කර තිබේ. ව්‍යාපාරිකයන් ගෑස් මිල වැඩි කර ගත්තේ ගෑස් ආනයනය අත්හිටුවා රට තුළ ගෑස් හිඟයක් නිර්මාණය කරමිනි. මේ වන විට කිරිපිටි ආනයනකරුවන් කිරිපිටි ආනයනය අත්හිටුවා ඇති නිසා රටපුරා කිරිපිටි හිඟයක් ඇතිව තිබේ.

මේ අනුව පෙනී යන්නේ රටේ ජනතාව කන්නේද, බොන්නේද, යන්න තීරණය කිරීමේ බලය මුළුමනින්ම ව්‍යාපාරිකයන් සතුකරගෙන තිබෙන බවය. මෙම තත්ත්වය වෙනස් කර ගන්නට දැන්වත් පියවර නොගතහොත් ඉදිරියේදී අර්බුද අවස්ථාවකදී පමණක් නොව සාමාන්‍ය තත්ත්වයේදීත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සාධාරණ මිලකට සම්පාදනය සඳහා හදිසි නීතියේ පිහිට පැතීමට සිදුවීම වැළැක්විය නොහැකි වනු ඇත.

# නවසීලන්තයේ නිව් ලින් ත්‍රස්තවාදී සිදුවීම සහ එහි ජාතික ජාත්‍යන්තර මානයන්




**ආචාර්ය පවිත්‍රා ජයවර්ධන**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය


නවසීලන්තයේ නිව් ලින්හි වෙළඳසලක දී අන්තවාදියකු සිදුකළ ත්‍රස්තවාදී ක්‍රියාව කියවා ගැනීම හරහා ජාතික ජාත්‍යන්තර දේශපාලනික මානයන් ගණනාවක් ස්පර්ශ කළ හැක. එම ප්‍රහාරය අයිසිස් අන්තවාදී ක්‍රියාවක් ලෙස හඳුනා ගැනීමත් සමග ගෝලීය ත්‍රස්තවාදයේ මානයත්, නවසීලන්තය තුළ පවතින ත්‍රස්තවාදී මර්දනය ගැන ජාතික නෛතික මානයත්, එය සිදු කළේ නවසීලන්තයේ ජීවත් වූ සරණාගත වීසා තත්ත්වයක සිටි සංක්‍රමණිකයෙක් යැයි හෙළි වීමත් සමග, සංක්‍රමණ, සරණාගත යනාදී මානයන් ද මෙකී සිදුවීමට එක් විය. එමෙන් ම අදාළ ප්‍රහාරකයා ශ්‍රී ලාංකික ජාතිකයෙක් බවට ප්‍රකාශයට පත් වීමත් සමග, මෙම සිදුවීම ශ්‍රී ලංකාවටත් ශ්‍රී ලාංකික සංක්‍රමණ ප්‍රජාවටත් බෙහෙවින් වලංගු සිදුවීමක් විය.

### සිදුවීම කෙටියෙන්

සැප්තැම්බර් තුන් වන දින දහවල්, ඕක්ලන්ඩ්හි නිව් ලින් ප්‍රදේශයේ සුපිරි වෙළඳසලක් වෙත ගිය පුද්ගලයකු, එහි සිටි පුද්ගලයන් හත් දෙනකුට පිහි ප්‍රහාර එල්ල කර තිබේ. අදාළ පුද්ගලයාගේ නම අහමඩ් ආතිල් මොහොමඩ් සම්සුදීන් (32) ලෙස තහවුරු කෙරිණ. මෙම පුද්ගලයා නවසීලන්තයේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස හඳුනාගෙන තිබූ පුද්ගලයෙකි. 2016 වසරේ සිට නවසීලන්ත ආරක්ෂක අංශවල දැඩි අවධානයක් ඔහු කෙරෙහි යොමුව තිබේ. ඒ ඔහු අයිසිස් අන්තවාදී අදහස් දරන්නෙකු සහ එම මතවාද පතුරවන්නට උත්සාහ කරන බව හඳුනා ගැනීමත් සමගය. 2017 දී ඕක්ලන්ඩ් ගුවන් තොටුපළෙන් සිරියාව බලා යෑමට උත්සාහ කර ඇති මෙම පුද්ගලයා භාරේ තිබී පිහි සහ අන්තවාදී අදහස් සහිත වීඩියෝ පට ද සොයා ගෙන තිබේ. ආසන්නතම සිදුවීම වූ දිනයේ දහවල් අහමඩ් සිය නිවසේ සිට වෙළඳපළට ගොස් ඇති අතර, නවසීලන්ත ආරක්ෂක අංශ එය නිරීක්ෂණය කර තිබේ. වෙළඳපළේදී පිහි ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කර තත්පර 60ත් 90ත් අතර කාලයක දී ඔහුව මර්දනය කිරීමට ආරක්ෂක අංශ ක්‍රියා කර තිබේ.

### ප්‍රහාරකයාගේ සංක්‍රමණික (වීසා) තත්ත්වය

සිදුවීමත් සමග ප්‍රහාරකයා කවරෙක් ද යන්න ගැන සැමගේ අවධානය යොමු විය. මෙම පුද්ගලයා 2011 දී ලංකාවේ සිට ශිෂ්‍යයෙකු ලෙස නවසීලන්තයට සංක්‍රමණය වූවෙකි. 2013 වසරේදී ඔහු නවසීලන්තයේ සරණාගත තත්ත්වය ලබා තිබේ. ඒ සඳහා ඔහු පෙන්වා තිබෙන්නේ තමන්ට නැවතත් සිය මව් රට වන ශ්‍රී ලංකාවට යාමට නොහැකි බවත්, තමන්ගේ ජනවර්ගය හේතුවෙන් (ඔහු දමිළ මුස්ලිම් ජාතිකයෙක් බව හඳුනා ගැනේ) තමන් මව් රටේ දී විවිධ ශාරීරික සහ මානසික පීඩාවලට මුහුණ දී ඇති බවත් ය. මෙම හේතුව සහ ඒ පිළිබඳ අනෙකුත් සාක්ෂි නවසීලන්ත බලධාරීන් ඒ අවස්ථාවේ පිළිගෙන තිබේ. කෙසේ වෙතත් 2016න් අනතුරුව මෙම පුද්ගලයාගේ අන්තවාදී මතයන් පිළිබඳ අවධානය යොමු වීමත් සමග, නවසීලන්ත බලධාරීන් තවදුරටත් සොයා ගෙන තිබෙන්නේ සරණාගත තත්ත්වය ලබා ගැනීම සඳහා මෙම පුද්ගලයා ඉදිරිපත් කළ තොරතුරු ව්‍යාජ ඒවා බවයි. ඒ සමග, 2018 දී සරණාගත තත්ත්වය නිෂ්ප්‍රභ කිරීමට රජය තීරණය කර තිබෙන අතර ඔහු ඒ පිළිබඳ අභියාචනයක් ඉදිරිපත් කර තිබේ. විවිධ කරුණු මත (ඔහු විටින් විට සිර ගත වී සිටීම ඇතුළු) මෙම අභියාචනය අවසන් වීම කල් ගත වී තිබේ. එම නිසා, නවසීලන්ත ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස තහවුරු කර ගෙන තිබුණ ද, ඔහුව රටින් පිටමන් කිරීමට නවසීලන්තයට හැකියාවක් තිබී නොමැත.

### ශ්‍රී ලංකාවට තිබෙන බලපෑම

මෙකී ප්‍රහාරය ශ්‍රී ලංකාවට ඉමහත් බලපෑමක් සිදු කරන බව ඉතා පැහැදිලි ය. ලෝකයේ ශ්‍රී ලංකාව ගැන තිබෙන අවබෝධය මූලික වශයෙන් කේන්ද්‍ර වී ඇත්තේ ත්‍රස්තවාදය, සිවිල් යුද්ධය සහ රට තුළ ඇති ජනවාර්ගික ආතතීන් ආදී කරුණු මතිනි. ලෝකයේ පොදු තත්ත්වය මෙසේ වුවත් නවසීලන්ත වැසියන් තුළ ලංකාව ගැන ඇති අවබෝධය තවත් විශේෂ කරුණු තුනක් මත පිහිටා තිබේ. එනම් ක්‍රිකට්, තේ සහ නවසීලන්තයේ ජීවත් වන ශ්‍රී ලාංකික ප්‍රජාවයි. මෙම කරුණු තුන මත නවසීලන්ත සාමාන්‍ය ජනයාට ශ්‍රී ලංකාව කෙරෙහි සිවිල් යුද්ධයට පරිබාහිර යම් පුළුල් අවබෝධයක් තිබේ. නවසීලන්ත අගමැතිනිය ද ඉතා ඍජුව කියා සිටියේ, ඔවුන් එම සිදුවීම දකින්නේ තනි සිදුවීමක් ලෙස විනා එය කිසිදු ජන ප්‍රජාවක නියෝජනයක් ලෙස නොවන බවයි. ශ්‍රී ලංකාවේ සිට නවසීලන්තයට ඇතුළු වන අවස්ථාවේ දී ඔහු අන්තවාදී මත දරන්නෙක් බවට සාක්ෂි නොමැති බව අගමැතිනිය තහවුරු කළා ය. ඔහු නවසීලන්තයේ දී අන්තවාදී මත වැළඳ ගෙන ඇතැයි පැවසේ. එම අදහසින්, මෙම සිදුවීම ශ්‍රී ලංකා - නවසීලන්ත සබඳතා කෙරෙහි නිෂේධනීය බලපෑමක් නොකරනු ඇත. නමුත්, පුළුල් අර්ථයෙන්, ලෝක ත්‍රස්තවාදය, අන්තවාදය යන ප්‍රපංචයන්හි කෙරෙහි ලංකාවේ නියෝජනයක් තිබේය යන අදහස වැළැක්විය හැකි නොවේ. මේ වන විටත් නවසීලන්ත නිව් ලින් සිදුවීමත් ලංකාව තුළ සිදුවූ පාස්කු ප්‍රහාරයත් අතර යම් සබඳකමක් තිබේ ද යන්න සොයා බැලීම කෙරෙහි අවධානය යොමු වී තිබේ.

### ත්‍රස්තවාදී ක්‍රියා මර්දනය කෙරෙහි නවසීලන්ත නෛතික තත්ත්වය

අදාළ සිදුවීමත් සමග අගමැතිනිය ප්‍රකාශ කළේ මේ වන විට පාර්ලිමේන්තුවේ සාකච්ඡා වන ත්‍රස්තවාදී ක්‍රියා වැළැක්වීමේ පනතට නව රෙගුලාසි එක් කිරීමේ ක්‍රියාවලිය හැකි ඉක්මණින් එනම් මේ මස අවසන් වන විට සම්පූර්ණ කිරීමට තමන් පියවර ගන්නා බවයි. ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් නවසීලන්තයේ මේ වන විට ක්‍රියාත්මක වන්නේ 2002 වසරේදී බලාත්මක කෙරුනු ත්‍රස්තවාදී මර්දන පනතයි. මෙය 2001 දී ඇමරිකාවේ සිදුවූ 9/11 ප්‍රහාරයට සමගාමීව බලාත්මක කෙරුණ කි. පසුගිය වසරවලදී අදාළ පනත විටින් විට සංශෝධනය කෙරෙන ලද අතර අවසාන වශයෙන් 2019 ක්‍රයිස්චර්ච් ප්‍රහාරයත් සමග එය තව දුරටත් බලගන්වන ලදී. කෙසේ වුව ද ත්‍රස්තවාදී ප්‍රහාරයක් වැළැක්වීම සඳහා තිබෙන නීති තවමත් ප්‍රමාණාත්මක නොවන බව පෙනෙන්නට තිබේ.

නිදසුනක් ලෙස, ත්‍රස්තවාදී ප්‍රහාරයක් සැලසුම් කිරීම සඳහා ප්‍රතිචාර දැක්වීමට නීතිය ශක්තිමත් නැත. මේ හේතුවෙන් ත්‍රස්තවාදී ප්‍රහාරයකට සූදානම් වීම යන චෝදනාවට දඬුවම් කිරීමට නවසීලන්ත නීති පද්ධතියට හැකියාවක් නැත. සිකුරාද සිදුවීමට අදාළ ව පෙනෙන්නට තිබෙන්නේ ද නීතියේ මෙම දුර්වලතාවයයි. කෙසේ වුවද 2019 ක්‍රයිස්චර්ච් ප්‍රහාරය සිදු වීමට පෙර තත්ත්වයට වඩා නවසීලන්ත ආරක්ෂක අංශ, මෙවැනි සිදුවීමක දී තමන් ක්‍රියාත්මක විය යුතු ආකාරය සහ වේගය ගැන සූදානම් බව මෙම සිදුවීමෙන් පසු තත්ත්වය නිරීක්ෂණය කිරීමෙන් පෙනෙන්නට තිබේ.

### නවසීලන්තය - ගැඹුරු ප්‍රජාතන්ත්‍රවාදයක් සහිත රාජ්‍යයක් ලෙස

අනෙකුත් රාජ්‍යයන් සමග සාපේක්ෂව බැලීමේ දී, නවසීලන්තය යනු සාමවාදී රාජ්‍යක් ලෙස ප්‍රසිද්ධ රාජ්‍යයකි. ලෝක සිතියමේ ප්‍රධාන භූ කලාපයන්ගෙන් වෙන්ව දුරස්ථ දූපතක් ලෙස පිහිටා තිබීම නිසා, නවසීලන්තයේ එක්තරා අතකින් ලෝක ගතිකයන්ගෙන් යම් තාක් දුරට වියුක්තව ක්‍රියාත්මක වීමේ හැකියාවෙන් යුක්ත ය. ලෝක දේශපාලනයේ නිෂේධනීය දෑ නවසීලන්තය වෙත පැමිණෙන්නේ අන් සියලු රාජ්‍යන් ඒවාට හසුව අවසාන වශයෙන් යැයි ද උත්ප්‍රාසජනකව කියැවේ. ප්‍රමාණය සහ හැකියාව අතින් අනෙත් බටහිර රාජ්‍යයන්ට සාපේක්ෂව කුඩා නිසා, කුඩා රාජ්‍ය මානසිකත්වයක් ද තිබේ. එහෙයින්, ලෝක දේශපාලන තත්ත්වයන් කෙරෙහි ආරක්ෂාකාරී ප්‍රවේශයක් (defensive approach) අනුගමනය කිරීම විනා ආක්‍රමණශීලී ප්‍රවේශයක් (offensive approach) නවසීලන්තය අනුගමනය නොකර යි.



නවසීලන්තය යටත්විජිත කොලනියකි. අදටත් එය බ්‍රිතාන්‍ය කිරීටයේ රාජ්‍යයක් වන අතර රාජ්‍ය ප්‍රධානියා බ්‍රිතාන්‍ය මහ රැජින යි. කෙසේ වෙතත්, යටත්විජිතකරුවන් මුල් බැස ගත් අනෙකුත් රාජ්‍යන්ට වඩා, එනම් ඔස්ට්‍රේලියාව හෝ ඇමරිකාව වැනි රාජ්‍යයන්ට වඩා, නවසීලන්තයේ මුල් අයිතිකරුවන් වන මෞරි ජනයාට රාජ්‍යයේ අයිතිය සම්බන්ධයෙන් වැඩි නෛතික හැකියාවක් ලැබීම හේතුවෙන් නවසීලන්තය සුවිශේෂී ආචාර ධාර්මික රාජ්‍යයක් ලෙස හඳුනා ගැනේ. මීට අමතරව, ගැඹුරු ප්‍රජාතන්ත්‍රවාදයක් සහිත රාජ්‍යක් ලෙස ද එය ප්‍රසිද්ධ ය. නවසීලන්තය යනු, පුරවැසිකම ලබා ගැනීමට පෙර සිය රාජ්‍යයේ ස්ථිර පදිංචිය දරන පුද්ගලයින්ට ජාතික මට්ටමේ මැතිවරණවලට ඡන්ද බලය ලබා දෙන එකම බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය යි. එරට විශ්වාස කරන්නේ, පුරවැසියෙකු වුව ද නොවුව ද යම් රටක ස්ථිර පදිංචි කරුවන් එහි පාලනයට හවුල් විය යුතු බවයි. නවසීලන්තයේ තවත් සුවිශේෂීත්වයක් නම්, අනෙකුත් බටහිර රටවලට වඩා සංක්‍රමණිකයින් සම්බන්ධ ප්‍රතිරෝධනය අවම රාජ්‍යක් වීම යි. එනම්, සංක්‍රමණික රාජ්‍යයන් අතරින් සංක්‍රමණිකයින්ට සාපේක්ෂව යහපත් පිළිගැනීමක් සහිත රාජ්‍යයක් ලෙස නවසීලන්තය හඳුනා ගැනේ.

මේ සියලු ආකාරයේ ක්‍රියා තුළින් නවසීලන්තය අපේක්ෂා කරන්නේ, රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ගැඹුරු කර ගනිමින්, සියල්ලන්ටම පිළිගැනීම සහ සමාන අවස්ථා ලබා දීමට යි. ඒ හරහා අන්තවාදී මතයන්වලට යාම වැළැක්වීමටත්, සියල්ලන්ගේම ආරක්ෂාව සුරක්ෂිත කිරීමටත් ය. කෙසේ නමුත්, කෙතරම් දුරට ඇතුළතින් රාජ්‍යයන් දේශපාලනිකව නිවැරදි වීමට උත්සාහ දැරුවත් ක්‍රයිස්චර්ක් සහ නිව් ලින් ප්‍රහාර අපට මතක් කරන කාරණය නම්, ලෝක ත්‍රස්තවාදය, අන්තවාදය හමුවේ, තනි තනි රටට වෙන වෙනම ඒවාට මුහුණ දීමේ අභියෝගයි. ක්‍රයිස්චර්ච් ප්‍රහාරයට පාදක වූ සුදු-අන්තවාදයත්, නිව් ලින් ප්‍රහාරයට පාදක වූ අයි එස් අයි එස් අන්තවාදයත් යන දෙකම, නවසීලන්ත භූමියෙන් පැන නැගුණු මතවාදයන් නොවුණත්, ඒවායෙන් පීඩාවට පත් වීමට සිදු වූයේ නවසීලන්ත ජනයාට යි.

### නිව් ලින් සිදුවීමත් සමග ඇති විය හැකි තත්ත්වයන්

සංක්‍රමණිකයෙකු මුල් කරගෙන බටහිර රටවල සිදු වන මෙවැනි සමාන ත්‍රස්තවාදී ක්‍රියා කෙරෙහි එම රාජ්‍යයන් වල ස්වදේශකයින් ප්‍රතිචාර දක්වන්නේ සංක්‍රමණ විරෝධී ප්‍රවේශයකිනි. ඒ සිය සමාජයන්වල මෙවැනි ආකාරයේ භීතිය, සැකය, සංත්‍රාසය උපදවන සුළු සිදුවීම් ඇති වන්නේ සංක්‍රමණිකයින් පැමිණෙන නිසාය යන සරල නිගමනයකට ඉතා පහසුවෙන් ඔවුන් පැමිණෙන නිසා ය. පවතින ප්‍රවණතාවය නම් මෙවැනි තනි පුද්ගල සිදුවීම ඉතා වේගයෙන් සමස්ත සංක්‍රමණ ජන ප්‍රජාවකට පොදු වේ සාමාන්‍යකරණය වීමයි.

නවසීලන්ත වැසියන් මෙම තත්ත්වය මෙසේ වුවමනාවට වඩා සරල නිගමනයකින් තේරුම් ගැනීමේ හැකියාව සහ ඒ ඇසුරෙන් සිය සංක්‍රමණික ප්‍රජාව කෙරෙහි ප්‍රතිරෝධයක් ඇති කර ගැනීම මේ මොහොතේ අවම වේ. ඒ පෙර සඳහන් කළ පරිදි එකී රාජ්‍යය අනෙකුත් රාජ්‍යන්ට සාපේක්ෂව මෙවැනි සංවේදී කරුණු ගැන ප්‍රගතිශීලී ප්‍රවේශයක් අනුගමනය කරන බැවිනි. කෙසේ වෙතත්, නවසීලන්තය සර්වකාලීන පරමාදර්ශී රාජ්‍යයක් නොවේ. නිවැරදිව කළමනාකරණය නොකළ හොත්, පසු කාලීනව සංක්‍රමණ සීමා කිරීම් සහ අධීක්ෂණය තීව්‍ර කරවන ප්‍රවණතාවයක ආරම්භක සිදුවීම මෙය විය හැක. මෙය පාදක කර ගනිමින් ත්‍රස්තවාදී මර්දන පනත ශක්තිමත් කරන අවස්ථාවේ ම, ආගමන විගමන සහ පුරවැසිභාවය ආදී නීතින් ද තවත් සීමා කිරීමට අවධානය යොමු විය හැක. ත්‍රස්තවාදී ක්‍රියා නිසා සිය එදිනෙදා ජීවිතය තුළ නිරන්තර පීඩාවට ලක් වීමට සිදු වුව හොත්, යම් මට්ටමක සංක්‍රමණ විරෝධයක් නවසීලන්ත ජන සමාජය තුළ ද පහසුවෙන් ඇති වීමේ හැකියාවක් ඇත. එහෙයින්, රාජ්‍ය තලයෙන් මෙන්ම සමාජමය තලයෙන් ද යම් කිසි ආතතියක් සංක්‍රමණිකයන් කෙරෙහි - විශේෂයෙන් ම මුස්ලිම් ජාතිකයින් කෙරෙහි - ඇතිවීම වැළැක්වීම, මේ මොහොතේ නවසීලන්ත දේශපාලනය තුළ ඉතාම තීරණාත්මක දෙය කි.